සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**22 | S | I**

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ 

## භූගෝල විද්‍යාව I

කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.**
- **I කොටස බහුවරණ ප්‍රශ්න 40කින් යුක්ත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුය.**
- **II කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිලිතුරු සැපයිය යුතුය. III වන කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරා ගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් ද, ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.**

## <u>I කොටස</u>


1. ශ්‍රී ලංකා 1:50000 මෙට්‍රික් සිතියම් වල භාවිතා වන සම්මත ලකුණු හා සංකේත අතරින් දිය මංකඩ, මඟීන් ගෙනයන තොටුපල යන ලක්ෂණ අයත් වනුයේ,

   i. ජල වහනය ii. සංචාරක තොරතුරු iii. භූ විෂමතා
   iv. මං මාවත් v. ජල සම්පාදන (.........)

2. 1:25,000 පරිමාණයට නිර්මාණය කරන ලද සිතියම් පත්‍රයක පිහිටි වැව් බැම්මක දිග 16cm කි. එහි සැබෑ දිග සඳහන් පිළිතුර තෝරන්න.

   i. 4 cm ii. 3.5 km
   iii. 4 km iv. 8 km
   v. 32 km (.........)

3. සමෝච්ච රේඛා සටහනේ දැක්වෙන A හා B භූ විෂමතා ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?




   i. බහිෂ් කන්ද, හුදකලා කන්ද
   ii. කොත් කන්ද, හුදකලා කඳුවැටිය
   iii. විච්ඡින්න සානුව, කොත් කන්ද
   iv. ඛනිජ කන්ද, හුදකලා කන්ද
   v. කොත් කන්ද, අසම මිතික කන්ද (.........)

4. 

සංකේතයෙන් භූ ලක්ෂණ සිතියම් වල දැක්වෙනුයේ,

   i. ප්‍රධාන මාර්ගය ii. අධිවේගී මාර්ගය iii. වේල්ල මත පිහිටි ප්‍රධාන මාර්ගය
   iv. ජීප් රථ මාර්ගය v. ඉදිකරමින් පවතින ප්‍රධාන මාර්ගය (.........)

5. කඩදාසියේ මුද්‍රිත සිතියම් සකස් කිරීම සඳහා අතීතයේදී භාවිතා කරන ලද උපකරණයක් අඩංගු පිළිතුර තෝරන්න.

   i. පරිගණකය ii. අංකන ඵලකය
   iii. සූපරික්ෂකය iv. මාලිමාව
   v. ඩිජිටයිසරය (.........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


6. ශ්‍රී ලංකා 1:50000 මෙට්‍රික් සිතියම් වල වෙරළ ලක්ෂණ, පහත්බිම් භූ විෂමතා ලක්ෂණ, උස් බිම් භූ විෂමතා ලක්ෂණ දැකිය හැකි ප්‍රදේශ පිළිවෙලින් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

i. අලුත්ගම, රක්වාන, දඹුල්ල
ii. යාපනය, කල්පිටිය, රත්නපුර
iii. මතුගම, කැකිරාව, ගාල්ල
iv. මඩකලපුව, කැකිරාව, දඹුල්ල
v. කල්කුඩා, කතරගම, මහියංගනය (.........)

7. භූගෝලීය දත්ත පද්ධතිය (GIS) තුළ දෛශික දත්ත ආකෘතිය පදනම් වනුයේ කුමක් මතද?

i. රේඛා ii. ලක්ෂ iii. බහු අස්‍ර iv. කලාප v. ඛණ්ඩාංක (..........)

8. ගෝලීය ස්ථාන ගතකිරීමේ පද්ධතියට අයත් මූලික උපාංග දැක්වෙන රූප සටහනේ A, B හා C යන ඉංග්‍රීසි අක්ෂර වලින් දක්වා ඇති මධ්‍යස්ථාන පිළිවෙලින් ඇතුලත් පිළිතුර තෝරන්න.




i. ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය, මෙහෙයුම් මධ්‍යස්ථානය, ඇන්ටනා මධ්‍යස්ථානය
ii. ග්‍රාහක මධ්‍යස්ථානය, මෙහෙයුම් මධ්‍යස්ථානය, පාලක උපාංගය
iii. ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය, පාලක මධ්‍යස්ථානය, ඇන්ටනා මධ්‍යස්ථානය
iv. පරිශීලක උපාංගය, අභ්‍යවකාශ මධ්‍යස්ථානය, පාලක උපාංගය
v. මෙහෙයුම් මධ්‍යස්ථානය, අභ්‍යවකාශ උපාංගය, පාලක උපාංගය (.........)

9. භූගෝල විද්‍යාවේ ඉතා ප්‍රයෝජනවත්ව හා කාර්යක්ෂමව තොරතුරු ඉදිරිපත් කළ හැකි බහුකාර්ය මෙවලමක් බවට පත්වී ඇත්තේ,

i. භූ ලක්ෂණ සිතියමයි
ii. අංකිත සිතියමයි
iii. තේමා සිතියමයි
iv. සම සංඛ්‍යා රේඛා සිතියමයි
v. මෙට්‍රික් සිතියමයි (.........)

10. යම්කිසි රටක අපනයන දිශාවන් සහ පරිමාණය දැක්වීම සඳහා සකස් කර ඇති තේමා සිතියම් වර්ගය දැක්වෙන පිළිතුර කුමක්ද?

i. සංයුක්ත තීරු ප්‍රස්තාරය
ii. සම සංඛ්‍යා රේඛා සිතියම
iii. තිත් සිතියම
iv. රේඛාංඛිත සිතියම
v. ධාරා සිතියම (.........)

11. කොන්රඩ් අසන්තතික කලාපය දැකිය හැකි වනුයේ,

i. ගොඩබිම් කලාපයේය
ii. මහද්වීපික තටක කලාපයේය
iii. ඉහල ප්‍රාවරණ කලාපයේය
iv අභ්‍යන්තර හර කලාපයේය
v. සාගරික කලාපයේය (.........)

12. නිශ්චිත භූමි ප්‍රදේශයක නිශ්චිත කාලයක් තුළ ජීවත්වන එකම විශේෂයකට අයත් සත්ව හෝ ශාක එකතුව හඳුන්වන්නේ

i. ජීව විශේෂය ලෙසය
ii. ජීව ප්‍රජාව ලෙසය
iii. ජීව ගහනය ලෙසය
iv. පරිසර පද්ධතිය ලෙසය
v. බියෝමය ලෙසය (.........)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

13. ශ්‍රී ලංකවේ පාෂාණ කලාප හා එම කලාපවල බහුල පාෂාණ පහත දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

| පාෂාණ කලාපය | පාෂාණ වර්ගය |
|---|---|
| 01. ජුරාසික පාෂාණ කලාපය | A. හුණුගල් පාෂාණ |
| 02. වන්නි සංකීර්ණය | B. ග්‍රීට් පාෂාණ |
| 03. මයෝසීන හුණුගල් තීරය | C. කොණ්ඩලයිට් පාෂාණ |
| 04. උස්බිම් ශ්‍රේණිය | D. මිග්මටයිඩ් පාෂාණ |

i. B A C D   ii. D C A B   iii. B D A C   iv. D A B C   v. D B A C   (.........)

14. ලෝකයේ බ්‍රසීලයේ හැරුණු විට විවිධ වර්ගයේ මැණික් ලැබෙන රටක් **නිවැරදිව** දැක්වනුයේ,

i. ශ්‍රී ලංකාව ය   ii. ඉන්දියාව ය   iii. ඕස්ට්‍රේලියාව ය
iv. දකුණු අප්‍රිකාව ය   v. කැනඩාව ය   (.........)


15. ගංගා ඛාදන ක්‍රියාවලියක් හා පරිවහන ක්‍රියාවලියක් පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න

i. උල්ලේඛය, ද්‍රාවණය   ii. සංඝර්ෂණය, සංකර්ෂණය
iii. උත්පාටනය, ප්‍රකර්ශනය   iv. උල්ලේඛය, සංකර්ෂණය
v. ද්‍රාව ක්‍රියාව, ද්‍රාවණය   (.........)

16. ඇලස්කාවේ සිට දකුණු ඇමරිකාව දක්වාද, නවසීලන්තයේ සිට උතුරට විහිදී ගොස් ජපන් දූපත් ඔස්සේ ඇලස්කාව දක්වා විහිදෙන යමහල් කලාපය **නිවැරදිව** දැක්වෙන පිළිතුර තෝරන්න,

i. අප්‍රිකාවේ ස්විභේද නිම්න කලාපය   ii. මධ්‍ය අත්ලාන්තික් වැටි කලාපය
iii. මධ්‍ය ධරණී මුහුද අවට කලාපය   iv. හිමාලය කලාපය
v. පරි පැසිපික් කලාපය   (.........)

17.




ඉහත සටහනේ පාංශු වර්ධනයට බලපාන සාධක අතරින් A B Cවශයෙන් දක්වා ඇති සාධක ඇතුලත් වරණය මින් කුමක්ද?

i. හිරු එළිය, බොරළු, සුළඟේ ක්‍රියාකාරිත්වය
ii. මානුෂ ක්‍රියා, දේශගුණය, පාංශු ජීවීන්
iii. වෘක්ෂලතා, දේශගුණය, කෘෂි රසායන වර්ග
iv. ජල සම්පාදනය, චෙන්ද්‍රීය පොහොර, කාලය
v. රසායනික පොහොර, ජල සම්පාදනය, මානුෂ ක්‍රියා   (.........)

18. ඛණිජ වල තද බව, බර වැනි කැපී පෙනෙන භෞතික ලක්ෂණයන්ගෙන් සමන්විත ඛණිජ හඳුන්වන්නේ,

i. බලශක්තිමය ඛණිජ ලෙසය   ii. අලෝහමය ඛණිජ ලෙසය
iii. යමුසු නොවන ඛණිජ ලෙසය   iv. ලෝහමය ඛණිජ ලෙසය
v. සිලිකාමය ඛණිජ ලෙසය   (.........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

19. මහද්වීප කාරක චලන (සිරස් භූ චලන) වලින් නිර්මානය වන භූ රූප පමණක් අඩංගු පිළිතුර මින් කුමක්ද?
   i, පලිහ ප්‍රදේශ, භූ ද්‍රෝණි, සාගරික ද්‍රෝණි
   ii නැමිකඳු, විභේද, මධ්‍ය සාගරික වැටි
   ii. සානු, විභේද, මහද්වීප තටකය
   iv. ඔත් නැමි, උලැඟි නැමි, ඒකානති නැමි
   v. හෝස්ටය, සුවිභේද නිම්නය, පලිහ ප්‍රදේශ (.........)

20. මහද්වීපික බෑවුමට යාබදව සාගර නිම්න පත්ලෙහි අවසාදිත තැම්පත් වීමෙන් නිර්මාණය වනුයේ,
   i. මධ්‍ය සාගරික වැටිය
   ii. පිටාර තැනිය
   iii. ආගාධ තැනිය
   iv. මහද්වීපික මායිම
   v. මහද්වීපික බෑවුම (.........)

21. ගංගාවක ආරම්භක ක්‍රියාවලිය හා ඊට අදාල ගංගා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. උල්පතකින් ආරම්භවීම. | A. වොල්ගා ගඟ |
| 2. වර්ෂාපතනය මගින් ආරම්භය | B. ලංකාවේ වියළි කලාපයේ ගංගා |
| 3. හිම හෝ ග්ලැසියර දියවීමෙන් | C. නයිල් ගංගාව |
| 4. විලකින් ආරම්භ වීම | D. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ගංගා |

   i. D C A B
   ii D B A C
   iii. D B C A
   iv. A B D C
   v. B D A C (.........)

22. සාගර තරංගයක පෙරපහර මගින් ඛාදනය කරගත් භාරය වැල්ල කලාපයේ පරිවහනය කරන විට වැල්ලට ලම්බකව සිදුවන පරිවහනය හා වැල්ලට සමාන්තරව සිදුවන පරිවහනය **නිවැරදිව** දැක්වනුයේ,
   i. අනුතීර, ප්ලවනය, පිළිසෝදාව
   ii. දමාගසන පහර, පිළිසෝදාව
   iii. වඩදිය හා බාදිය
   iv. පිළිසෝදාව හා අනුතීර ප්ලවනය
   v. යටිප්‍රවාහ හා පෙරළිගමන (.........)

23. වර්තමානයේ ශ්‍රී ලංකාවේ කොළඹ, ගම්පහ, බදුල්ල, කළුතර, මන්නාරම යන ප්‍රදේශවල වායු ගෝලයේ ව්‍යාප්ත වන ධූමිකා තත්වයට හේතුව වශයෙන් අනුමාන කරනුයේ,
   i. කොළඹ පුරවර ප්‍රදේශයේ අධික කාර්මීකරණය
   ii. වියළි කලාපීය ප්‍රදේශවල කෘෂිකර්මාන්තයේදී යෙදවුම් භාවිතය
   iii. අධික රථවාහන ධාවනය
   iv. වනාන්තර විනාශය
   v. අසල් වැසි ඉන්දියාවේ කාර්මීකරණය බලපෑම නිසා ඇතිවූ දූෂිත වායු පැතිරීම. (.........)

24. ගුවන් ගමන්, රථවාහන ගමනාගමනය සහ යුධ කටයුතු ආදී මානුෂ කටයුතු කෙරෙහි ප්‍රබලවම බලපාන කාලගුණික සංසිද්ධිය දැක්වෙන වරණය තෝරන්න,
   i. උෂ්ණත්වය
   ii. දෘශ්‍යතාවය
   iii. වර්ෂාපතනය
   iv. ආර්ද්‍රතාවය
   v. පීඩනය (.........)

25. සූර්යයාගෙන්, පොළවට ලැබෙන දෘශ්‍ය ආලෝකයෙන් විශාල ප්‍රමාණයේ පරාවර්තනය කොට ආපසු ඉහළට යවන සංසිද්ධිය වන්නේ,
   i. වාෂ්පීකරණයයි
   ii. අධි ධාවනයයි
   iii. වළාකුළු නිර්මාණයයි
   iv. වර්ෂණයයි
   v. ඇල්බිඩෝවයි (.........)

26. ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය ස්ථාවර තත්වයට පත් වෙමින් පවතින බව පැහැදිලි වන්නේ,
   i. ක්‍රි.ව. 1970 පසුවය
   ii. ක්‍රි.ව. 1974 පසුවය
   iii. ක්‍රි.ව. 2010 පසුවය
   iv. ක්‍රි.ව. 1980 පසුවය
   v. ක්‍රි.ව. 1920 පසුවය (.........)

AWP - EXAM


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

27. 2015 ලෝක ජන සංඛ්‍යා දත්ත වලට අනුව මිනිත්තුවකට සිදුවන උපත් හා මරණ සංඛ්‍යාව **නිවැරදිව** ඇතුළත් වරණය තෝරන්න,

i. 278, 10 ii. 109, 23 iii. 278, 109 iv. 278, 169 v. 169, 109 (.........)

28. 2050 දී ලෝකයේ වඩාත්ම ජනාධික රටවල් 10 ලෙස ප්‍රක්ෂේපිත දත්ත සටහනට අනුව අප්‍රිකානු මහද්වීපයට අයත්වන රටවල් කාණ්ඩය නිවැරදිව දැක්වනුයේ,

i. ඉතියෝපියාව, කොංගෝ ජනපදය, නයිජීරියාව
ii. නයිජීරියාව, ගැබෝන්, රියුනියන්
iii. නයිජීරියාව, ඊජිප්තු, උගන්ඩාව
iv. ඉතියෝපියාව, ගැබෝන්, අන්ගෝලාව
v. නයිජීරියාව, ඉතියෝපියාව, දකුණු අප්‍රිකාව (.........)

29. ජන විද්‍යාත්මක සංසිද්ධියක් ඇතුලත් වරණය තෝරන්න

i. ආබාධිත බව ii දරිද්‍රතාවය iii. වියපත් වීම
iv. ආහාර සුරක්ෂිතතාවය v. ස්ත්‍රීපුරුෂ සමාජභාවය (.........)

30. එක්සත් ජාතීන්ගේ 2015 ජන සංගණනය වාර්තා වලට අනුව දළ උපත් අනුපාතිකය ඉහළ අගයක් ගන්නා සංවර්ධනය වෙමින් පවතින රටවල් යුගලයක් දැක්වෙන පිළිතුර කුමක්ද?

i. පාකිස්ථානය, ශ්‍රී ලංකාව ii බංගලාදේශය, චීනය
iii. චීනය, ඉන්දියාව iv. පාකිස්තානය, බංග්ලාදේශය
v. ඉන්දියාව, නේපාලය (.........)


31. ශ්‍රී ලංකාවේ මුළු ජන සංඛ්‍යාවෙන් 28% ප්‍රතිශතයක් ජීවත්වන පළාත් වනුයේ,

i. උතුරු මැද පළාතය ii බස්නාහිර පළාතය iii. උතුරු පළාතය
iv. වයඹ පළාතය v. දකුණු පළාතය (.........)

32. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතා සංගුණකය හෙවත් ගිණි සංගුණකය 0.48% දක්වා අඩුවීමට හේතු වූ සාධකයේ ඇතුලත් වන්නේ,

i. ජන සංඛ්‍යාව පාලනය කිරීමයි. ii. රජයේ රැකියා සම්පාදනයයි.
iii. ආදායම සමානව බෙදා දීමයි. iv. සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුනු කිරීමයි.
v. අඩු ආදායම් පවුල් සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි. (.........)

33. යුරෝපා රටවල දේශසීමා හරහා විහිදෙන දැවැන්ත නාගරික වේදිකාවක පිහිටීම රූප සටහනේ දැක්වේ. එය **නිවැරදිව** නම් කර ඇති පිළිතුර තෝරන්න.



i. චිකාගෝ සිට පීටර්ස්බර්ග් හරහා දිවෙන චිපිට්ස් නගර යාය
ii. මැන්චෙස්ටර් සිට උතුරු ඉතාලිය දක්වා විහිදී ඇති බ්ලූ බනානා කලාපය
iii. මධ්‍යධරණී මුහුදුබඩ සිට වැලෙන්සියා දක්වා ඇති ගෝල්ඩන් බනානා කලාපය
iv. මධ්‍යම යුරෝපයේ පෝලන්තයේ සිට ඔස්ට්‍රියාව දක්වා විහිදුනු ග්‍රීන් බනානා කලාපය
v. චිකාගෝ සිට පීටර්ස්බර්ග් දක්වා විහිදුනු නාගරික කලාපය (.........)

34. ලෝකයේ නාරීකරණය ආශ්‍රිතව ඇතිවී ඇති පාරිසරික ගැටලු පහත දැක්වේ. ඒවා බහුලව හඳුනාගතහැකි ප්‍රදේශ ඇතුලත් පිළිතුර කුමක්ද?

A- අධික වායු දූෂණයක් පවතින නගරයකි.
B- නාගරික අපද්‍රව්‍ය නිසිලෙස බැහැර නොකිරීම නිසා ගැටළු මතුවී ඇති නගරයකි.

i. කුල්නා නගරය, බංග්ලාදේශයේ රාජ්ෂාහි නගරය
ii. පිලිපීනයේ මැනිලා නගරය, කුල්නා නගරය
iii. චීනයේ ටියැංජින් නගරය, බංග්ලාදේශයේ රාජ්ෂාහි නගරය
iv. චීනයේ ෂැංහයි නගරය, ඉන්දියාවේ නවදිල්ලි නගරය
v. ඉන්දියාවේ කම්පාලා නගරය, පිලිපීනයේ රාජ්ෂාහි නගරය (..........)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

35. කෘෂිකර්මාන්තයේදී රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන අහිතකර පාරිසරික බලපෑමක් ඇතුලත් වරණය කුමක්ද?

i. වගාවට අහිතකර කෘමීන් වර්ධනය
ii. දිළීර මර්ධනය
iii. ජලාශවල ඇල්ගී වර්ධනය
iv. වගාවල අහිතකර වල්පැලෑටි මර්දනය
v. අස්වැන්න සාපේක්ෂව පහළයාම (.........)

36. ලෝක බැංකුව සහ නාගරික සංවර්ධන අධිකාරිය උපකල්පනය කර ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ සැබෑ නාගරීකරණ මට්ටම ලෙස හඳුනාගෙන ඇත්තේ,

i. 48 % ය  ii 74.4 % ය  iii. 45 % ය  iv. 18.2 % ය  v. 66 % ය (.........)

37. ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය වෙරළබඩ ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වීමට බලපෑ ප්‍රබල මානුෂ හේතුව වන්නේ

i. රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමයි.
ii. සංවර්ධන ව්‍යාපෘති වල ක්‍රියාත්මක වීමයි.
iii. නාගරීකරණය හා කාර්මීකරණයයි.
iv. ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ දියුණුවයි.
v. බටහිර ජාතීන්ගේ ආගමනයකි. (.........)

38. ඇමරිකා එක්සත් ජනපදයේ බොෂ්ටන් සිට වොෂිංටන්ස් දක්වා නගර යාය හැඳින්වීමට 'Bos Wash' යන යෙදුම ඉදිරිපත් කළේ,

i. කාල් රිටර් විසිනි
ii. ඩිකින්සන් විසිනි
iii. ජීන් ගොට්මාන් විසිනි
iv. පැට්රික් ගෙඩීස් විසිනි
v. රොබට් බ්‍රේයින් විසිනි (.........)

39. නිෂ්කර්ෂක කර්මාන්ත දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න

i. යකඩ හා වානේ, සිමෙන්ති
ii. අළුහුණු, ගල් අඟුරු
iii. පෙට්‍රෝ රසායනික, සිමෙන්ති
iv. ගල් අඟුරු, යපස්
v. පෙට්‍රෝලියම්, යකඩ හා වානේ (.........)

40. මතුපිට කැණීම් මගින් ලබාගන්නා ඛනිජයක් වනුයේ

i. යපස් ය
ii. ගල් අඟුරු ය
iii. කළුගල් ය
iv. පෙට්‍රෝලියම් ය
v. මිනිරන් ය (.........)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

භූගෝල විද්‍යාව I

## II කොටස

01) ඔබට සපයා ඇති 1:50 000 මෙට්‍රික් සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i සිතියම් ප්‍රදේශයේ ජල සම්පාදනය සඳහා උපකාරී වූ භෞතික ලක්ෂණය නම් කරන්න. (ල. 01)

ii. සිතියම් ප්‍රදේශය අයත් වන පළාත් දෙකක් හා දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ල. 02)

iii. භූමි පරිභෝගය යටතේ සිදුකරන මානව කටයුතු තුනක් නම්කරන්න. (ල. 03)

iv. A-B, C-D, E-F මගින් දැක්වෙන භෞතික ලක්ෂණ නම් කරන්න. (ල. 03)

v අප්‍රධාන මාර්ගය හා භූ විෂමතාවය අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ල. 05)

vi සිතියම් ප්‍රදේශයේ වයඹ කාර්තුව හා ගිණිකොන දිග කාර්තුව අතර වෙනස්කම් තුනක් නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ල. 06)

02) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත වර්ග යොදාගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

i. අන්දීස් කඳුවැටිය
ii. අමූර් ගංගාව
iii. කලහාරී කාන්තාරය
iv. මෙක්සිකෝ බොක්ක
v. අගුල්හාස් ප්‍රවාහය
vi. වික්ටෝරියා විල
vii. රුවාපෙහු ගිනිකන්ද
viii. කර්කටක නිවර්තන රේඛාව
ix. පසුගිය දෙසැම්බර් මාසය අවසන් වන විට නව කොරෝනා වෛරස ආසාදිතයන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වූ යුරෝපා රට
x. ලෝක මානව හිමිකම් සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය (ල. 10)

NWP - EXAM




මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## III කොටස

03) i. දත්ත හා තොරතුරු අතර වෙනස පහදන්න. (ල. 2)

ii. පහත සටහනේ හිස්තැන් සඳහා ගැලපෙන පිළිතුරු පහත දී ඇති වරහන තුළින් තෝරා ලියන්න. (ල. 3)





(සමීක්ෂණ/සන්තතික දත්ත/අන්තර්ජාලය/ප්‍රශ්නාවලි/විමසීම/ප්‍රාථමික දත්ත/ගුවන් ඡායාරූප/මිනුම්)

iii. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී පර්යේෂකයකු මුහුණ පාන අභියෝග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

iv. ද්විතීයික දත්ත භාවිතයේදී ඇති වාසි දෙකක් හා අවාසියක් කෙටියෙන් පහදන්න. (ල. 6)

04) i. භූ ලක්ෂණ සිතියමක් යනු කුමක්ද? (ල. 2)

ii. 1:50,000 භූ ලක්ෂණ සිතියමක ආකෘතියක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




a. B අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානයේ සඳහන් වන්නේ කුමක් ද? (ල. 1)

b. D අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශය නම් කර එහි සඳහන් වන තොරතුරු දෙකක් දක්වන්න. (ල. 3)

c. F අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ දැක්වෙන තොරතුරු දෙකක් නම් කරන්න. (ල. 2)

iii. භූ ලක්ෂණ සිතියමක් භාවිතයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පහදන්න. (ල. 3)

iv. භූ ලක්ෂණ සිතියමක් භාවිතයේදී හා අංකිත සිතියම් භාවිතයේදී හඳුනාගත හැකි සමාන ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ල. 4

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05) i. භූගෝලීය තොරතුරු කාර්යක්ෂමව ඉදිරිපත් කළ හැකි බහුකාර්යය මෙවලමක් වූ අංකිත සිතියම්කරණයට දායක වන නව ක්‍රමවේද නම් කරන්න. (ල. 3)


ii. නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදවල පොදු ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ල. 4)

iii. භූ ලක්ෂණ සිතියම් භාවිතයට වඩා අංකිත සිතියම් භාවිතයේ ඇතිවන ගැටළු දෙකක් කෙටියෙන් හඳුන්වන්න (ල. 5)

iv. වර්තමානයේ ඇතිවන සිතියම් භාවිතය වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වීමට හේතු දෙකක් කෙටියෙන් පහදන්න. (ල. 3)

06) i. දුරස්ථ සංවේද ක්‍රියාවලිය යන්න කෙටියෙන් හඳුන්වන්න (ල. 2)

ii. දුරස්ථ සංවේදයේදී සිදුවන ක්‍රියාවලියන් දැක්වෙන පහත රූප සටහනෙහි A සිට F දක්වා නම් කරන්න. (ල. 3)




iii. චන්ද්‍රිකා තාක්ෂණය මගින් දුරස්ථ සංවේදයට අවශ්‍ය තොරතුරු ලබාගන්නා ආකාරය ඉහත රූප සටහන ද ආධාර කරගෙන කෙටියෙන් පහදන්න. (ල. 4)

iv. දුරස්ථ සංවේදී ක්‍රියාවලිය භාවිතයට ගන්නා ක්ෂේත්‍ර දෙකක ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

22 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..............................

# භූගෝල විද්‍යාව II

කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

## භෞතික භූගෝල විද්‍යාව

01) i. පද්ධතියක් යනු කුමක් දැයි හඳුන්වන්න. (ල. 4)

ii. පද්ධතියක ක්‍රියාකාරීත්වය හා ශක්තිය හුවමාරු වීමේ ස්වභාවය අනුව බෙදිය හැකි ප්‍රධාන පද්ධති වර්ග තුන නම් කර ඊට උදාහරණය බැගින් සපයන්න. (ල. 4)


iii. ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති තර්ජනයට ලක්ව ඇති ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 6)

iv. තර්ජනයට හා පරිහානියට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති ආරක්ෂා කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

02) i. හුණුගල් නිර්මාණය වන ක්‍රම දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 4)

ii. ලෝකයේ හුණුගල් (කාස්ට්) භූ දර්ශනය හඳුනාගත හැකි ප්‍රදේශ හතරක් නම් කරන්න. (ල. 4)

iii. පහත දැක්වෙන කාස්ට් භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය සිදුවන ආකාරය විස්තර කරන්න. (ල. 6)




iv. භූගත ජලය දූෂණය වීමට බලපාන සාධක තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 6)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03) i. ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන නම් කරන්න. (ල. 3)

ii. වර්ෂාපතනයේ කෙටි කාලීන බලපෑම් තුනක් විස්තර කරන්න. (ල. 6)

iii. a). කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයට අනුව නිවර්තන දේශගුණ වර්ගයට (A) අයත්වන උප වර්ග නම් කරන්න. (ල. 3)


b). ඉන් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන දේශගුණ වර්ගය නම් කර ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 2)

iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වර්ෂාපතන රටාව ජන ජීවිතයට බලපාන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 6)

04) i. යමකම ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ල. 3)

ii. පහත සිතියමෙහි දක්වා ඇති ගිනිකඳු නිවැරදි ව ලකුණු කර ඇති අක්ෂර නාමය සමග නැවත ලියා දක්වන්න. (ල. 4)

| | | | |
|---|---|---|---|
| - ෆූජියාමා | - හෙක්ලා | - ශාන්ත හෙලේනා | - මයෝන් |
| - විසුවියස් | - මොනාලෝආ | - ක්‍රැකටෝවා | - එට්නා |




iii. ආක්‍රාන්ත යමහල් ආශ්‍රිතව නිර්මාණය වන භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 6)

iv. යමහල් ප්‍රදේශ ආශ්‍රිතව නිර්මාණය වන භූමි ප්‍රදේශයන් ආර්ථික වශයෙන් වැදගත් වන ආකාර දෙකක් විස්තර කරන්න. (ල. 4)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## II කොටස
## මානුෂ භූගෝල විද්‍යාව

05).

**ජාත්‍යන්තර සංක්‍රමණිකයන්**
**සංවර්ධිත හා සංවර්ධනය වන කලාප වලට බෙදී ගොස් ඇති ආකාරය (1990-2017)**

| වර්ෂය | ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ සංඛ්‍යාව (මිලියන) | සංවර්ධිත රටවල් තුළ | | සංවර්ධනය වෙමින් පවතින රටවල් | |
|---|---|---|---|---|---|
| | | සංක්‍රමණිකයන් සංඛ්‍යාව (මිලියන) | ප්‍රතිශතය | සංක්‍රමණිකයන් සංඛ්‍යාව (මිලියන) | ප්‍රතිශතය |
| 1990 | 152.5 | 82.4 | 54.0 | 70.1 | 46.0 |
| 1995 | 160.7 | 92.3 | 57.4 | 68.4 | 42.6 |
| 2000 | 172.6 | 103.4 | 59.9 | 69.2 | 40.1 |
| 2025 | 190.5 | 116.3 | 61.0 | 74.2 | 39.0 |
| 2010 | 220.0 | 130.7 | 59.4 | 89.3 | 40.6 |
| 2015 | 247.6 | 140.3 | 56.7 | 107.3 | 43.3 |
| 2017 | 257.7 | 146.0 | 56.7 | 111.7 | 43.3 |

මූලාශ්‍රය : (2017) එන්.කේ. දන්ගල්ල, මානුෂ භූගොල විද්‍යා අධ්‍යයනය

i. ජාත්‍යන්තර සංක්‍රමණ රටාව අනුව 2000-2017 වර්ග තුළ වගුවේ දැක්වෙන සංක්‍රමණිකයන් බහුලව සිටින රටවල විශේෂ ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ල.4)

ii. ජාත්‍යන්තර සංක්‍රමණ සපයන ප්‍රධානත ම භූගෝලීය කලාපය වන ආසියා කලාපයේ රටවල් හතරක් නම් කරන්න. (ල.4)

iii. ජාත්‍යන්තර සංක්‍රමණ කෙරෙහි බලපාන සාධක තුනක් කෙටියෙන් පැහදිලි කරන්න. (ල.6)

iv. සංක්‍රමණ හේතුවෙන් ගමනාන්ත රටවල ඇතිවන ධනාත්මක බලපෑම් තුනක් සුවිශේෂත්වය සාකච්ඡා කරන්න. (ල.6)

06) i. නාගරීකරණය යනු කුමක් දැයි හඳුන්වන්න. (ල. 3)

ii. නාගරික ප්‍රදේශයක කේන්ද්‍රයේ සිට අවට ප්‍රදේශවලට ව්‍යාප්ත වන ක්ෂේත්‍ර පහක් නම් කරන්න.(ල. 5)

iii. ඉහත නම් කරන ලද ක්ෂේත්‍ර දෙකක ව්‍යාප්තිය සිදුවන ආකාරය විස්තර කරන්න. (ල. 6)

iv. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිතව මතුව තිබෙන ගැටළු තුනක් සාකච්ඡා කරන්න. (ල. 6)

07) i. ප්‍රාග් හා පූර්ව ඓතිහාසික යුගවලදී ශ්‍රී ලංකාවේ ජනාවාස පැවැති බවට සාධක හමුවන ප්‍රදේශ තුනක් නම් කරන්න. (ල. 3)

ii. a). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ග්‍රාමීය ජනාවාස වර්ග තුනක් නම් කරන්න. (ල. 3)

b). ඉන් එක් ගම්මානයක ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 2)

iii. ග්‍රාමීය ජනාවාසයක් හා නාගරික ජනාවාසයකින් වෙන්කර හඳුනා ගැනීමට භාවිතා කරනු ලබන නිර්ණායක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iv. ශ්‍රී ලංකාවේ ගැමි නාගරික ජනාවාසයක ලක්ෂණ විස්තර කරන්න. (ල. 6)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
NWP - EXAM

08) i. කෘෂිකාර්මික තාක්ෂණය යටතේ අවධානය යොමු කරන ලද අංශ හතරක් නම් කරන්න. (ල. 2)

ii. හරිත විප්ලවය යටතේ කෘෂි තාක්ෂණය දියුණු වූ ආකාරය විස්තර කරන්න. (ල. 6)

iii. නවීන කෘෂි තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීම නිසා මතුව ඇති ප්‍රධාන ගැටළුවක් වන 'කෘෂිකාර්මික ඒකාධිකාරිත්වය' පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ල. 6)

iv. පරිසර හිතකාමී ඓන්ද්‍රීය කෘෂිකර්මාන්තයේ භාවිතා කරනු ලබන ක්‍රමවේද තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ල. 6)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

முதலாம் தவணைப் பரீட்சை - தரம் 13 - 2020

First Term Test - Grade 13 - 2020

**ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම - හපුතලේ - 76**




1:50,000



# පළමු වාර පරීක්ෂණය - 2020
## භූගෝල විද්‍යාව I - 13 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 04 | 9) | 02 | 17) | 02 | 25) | 03 | 33) | 04 |
| 2) | 03 | 10) | 05 | 18) | 04 | 26) | 04 | 34) | 03 |
| 3) | 03 | 11) | 01 | 19) | 01 | 27) | 03 | 35) | 03 |
| 4) | 02 | 12) | 02 | 20) | 03 | 28) | 01 | 36) | 01 |
| 5) | 04 | 13) | 03 | 21) | 02 | 29) | 03 | 37) | 05 |
| 6) | 05 | 14) | 01 | 22) | 04 | 30) | 04 | 38) | 03 |
| 7) | 05 | 15) | 02 | 23) | 05 | 31) | 02 | 39) | 04 |
| 8) | 01 | 16) | 05 | 24) | 02 | 32) | 05 | 40) | 03 |

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40 යි)

### I - කොටස

01) i. ගංගාව

ii. ඌව පළාත, සබරගමු පළාත
මොණරාගල දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය


iii. වී වගාව/ ගෙවතු වගාව/ ශේෂ වගාව

iv. A - B අවතල බෑවුම, C - D කපොල්ල, E - F ආයතගාමී නිම්නය

v. කඳු අතර පිහිටි තැනිතලා ප්‍රදේශයේ ඇත.
මැද බැද්ද ආසන්නයේ කපොල්ල ඒ හරහා ඉදිකර ඇත.

vi. රළු භූ විෂමතාව වයඹ-ගිණිකොන රැලි බිම
ජනාවාස ව්‍යාප්තිය වයඹ අඩුයි.
මාර්ග ව්‍යාප්තිය වයඹ අඩුයි.
භූමි පරිභෝග කටයුතු ගිණිකොණ/වයඹ වනාන්තර

02) පිළිතුරු සිතියමේ සපයා ඇත.





මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## III කොටස

03) i. දත්ත - විමර්ශන හෝ විශ්ලේෂණය සඳහා රැස්කළ කරුණු හා සංඛ්‍යා
තොරතුරු - දත්ත සංවිධානය කොට සකස් කිරීමෙන් පසුව අර්ථාන්විතව ප්‍රයෝජනවත් ලෙස ඉදිරිපත් කිරීමයි.
ii. A - ප්‍රාථමික දත්ත / B - සමීක්ෂණ / C - මිනුම් / D - ප්‍රශ්නාවලි / E-F - අන්තර්ජාලය/ගුවන් ඡායාරූප
iii. කාලය හා පිරිවැය අධික වීම.
ක්ෂේත්‍රයට ගොස් දත්ත රැස් කිරීමේදී විධ ගැටළුවලට මුහුණදීම.
iv. වාසි
1. කාලය හා පිරිවැය ඉතිරි වීම.
2. තම දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම.
3. තම පර්යේෂණයට අදාළ කර ගැනීමේදී වෙනත් අයෙක් රැස්කළ දත්ත නිසා නොගැලපීම් ඇති වීම.

04) i. භූමියේ ඇති ලක්ෂණ පරිමාණයකට අනුපාතව වර්ණ, සංකේත, අක්ෂර හා රේඛා භාවිතාකර පැතලි තලයක දින ලද සටහනයි.
ii. a. සිතියමේ නම
b. ඇතුළු මායිම් තීරුව - ගෝලීය ඛණ්ඩාංක (අක්ෂාංශ හා දේශාංශ) / ජාතික ඛණ්ඩාංක / මාර්ග ගමනාන්ත
c. දිශාව / පරිමාණය / සූචකය / යාබද සිතියම් සටහන / පරිපාලන මායිම් දක්වන සටහන
iii. භූ ලක්ෂණවලට අවකාශීය ව්‍යාප්තිය පැහැදිලි කර හැකි වීම.
කිසියම් ස්ථානයක නිවැරදි පිහිටීම හඳුනාගත හැකි වීම.
භූ ලක්ෂණ අතර සම්බන්ධතාවය පැහැදිලිකල හැකිවීම.
iv. 1. දෙකෙහිම ඛණ්ඩාංක භාවිතය නිසා නිවැරදි පිහිටීම හඳුනා ගත හැකිවීම.
2. ලක්ෂය/රේඛා/බහු අස්‍ර මගින් අවකාශීය දත්ත නිරූපණය.

05) i. GIS /GPS /RS

ii. දියුණු තාක්ෂණ උපකරණ භාවිතය.
ගොලීය ඛණ්ඩාංක මගින් නිවැරදි පිහිටීම දැක්වීම.
අවකාශීය මෙන්ම අවකාශීය නොවන තොරතුරු නිරූපනය
පහසුවෙන් යාවත්කාලීන කිරීම
පහසුවෙන් හුවමාරු කිරීම.
විශාල ප්‍රමාණයක් ගබඩා කල හැකිවීම.

iii තාක්ෂණය ගැටළු ඇතිවීම.
තාක්ෂණික දැනුම නොමැතිවීම.
සන්නිවේදන දුර්වලතා පැවතීම.

iv. වර්තමානයේ තොතුරු තාක්ෂණයේ දියුණුව සමඟ සිතියම් විද්‍යාව දියුණුවීම.
සිතියම් ක්ෂේත්‍රයට අදාල මෘදුකාංග විශාල ප්‍රමාණය් බිහිවී තබීම.
ස්මාට් ජංගම දුරකථන භාවිතය.

06) i. පෘතුවිය මත ඇති වස්තුවක් භෞතිකව ස්පර්ශ නොකොට ඒ මගින් පරාවර්තනය කරන ශක්තිය දූෂණය කර ගැනීම, පටිගත කරගැනීම, නිරීක්ෂණය කිරීම හා වටහාගැනීම තුලින් සිතියම් නිර්මාණයට අත්‍ය දත්ත හා තොරතුරු සම්පාදනය කිරීමේ ක්‍රමවේදයයි.
ii. A – ශක්ති මූලාශ්‍රය (සූර්යයා) / B – ඉලක්කගත වස්තුව / C – සංවේදකය/චන්ද්‍රිකාව / D – සැකසීමේ මධ්‍යස්ථානය / E- විශ්ලේෂණය / F – භාවිතය/යෙදුම
iii. චන්ද්‍රිකා තාක්ෂණය හා භූ සමකාලීක/ධ්‍රැවක චන්ද්‍රිකා විස්තර විය යුතුය
iv. 1. කාලගුණ හා දේශගුණ විද්‍යාව ආශ්‍රිත අධ්‍යයනවලදී
2. ස්වාභාවික ව්‍යවසන පිළිබඳව
3. සාගර විද්‍යාව
4. හමුදා මෙහෙයුම්


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## භූගෝල විද්‍යාව II පත්‍රය - පිළිතුරු

### I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01) i. පද්ධතියක් යනු සංරචක රාශියකින් සමන්විත එකිනෙක සම්බන්ධතාවයෙන් යුතුව නිශ්චිත සීමාවක් තුළ ක්‍රියාත්මක වන ව්‍යූහයකි. (ගැලපෙන නිවැරදි නිර්වචනයකට - ලකුණු 4)

ii. හුදෙකලා පද්ධති (සෞරග්‍රහ මණ්ඩලය) / ආවෘත පද්ධති (පෘථිවිය) / විවෘත පද්ධති (ඕනෑම පරිසර පද්ධතියක්) (ලකුණු 2 බැගින් - ල. 6)

iii. වනාන්තර හෙළි කිරීම / කඩොලාන විනාශය / තෙත් බිම් ගොඩ කිරීම / ජාන මංකොල්ලය / වැලි ගොඩ දැමීම ආදිය (තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

iv. පරිසර සංවිධාන ඒකරාශී වීම / විවිධ නීති රීති හා අණ පණත් ක්‍රියාත්මක කිරීම / ජනතාව දැනුම්වත් කිරීම / මධ්‍යම පරිසර අධිකාරියට බලය පැවරීම ආදිය (තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

02) i. ජෛන්ද්‍රීය හුණුගල් නිර්මාණය හා රසායනික වශයෙන් අවක්ෂේප වී නිර්මාණය වීම විස්තර විය යුතුය (ල. 4)

ii. යුගෝස්ලෝවියාවේ ස්ලෝවේනියා ප්‍රදේශය / යුකටාන් අර්ධද්වීපය / ශ්‍රී ලංකාවේ / රුසියාවේ අංගාරා හා යෙනිසි ප්‍රදේශය (ල. 4)

iii. A - ඩෝලයින් (කුමුටුවල) / B - පොනෝර් / C - අතුරුදන් වන ගංගාව / D - උවාලා / E - පොල්ජේ / F - පරජනිත ගංගාව (තුනක් නම් කර විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

iv. අධික ලෙස ජල සම්පාදනය / කෘමිනාශක භාවිතය / වල්නාශක භාවිතය / ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය / රසායනික පොහොර භාවිතය (සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

03) i. ගෝලීය සාධක / කලාපීය සාධක / ස්ථානීය සාධක (ල. 3)

ii. අධික වර්ෂාපතනය නිසා නායයෑම / පාංශු ඛාදනය වේගවත් වීම / ජලාශ හා ගං පත්ල ගොඩවීම (යනාදී බලපෑම් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

iii. a). Af - නිවර්තන තෙත් / Am - නිවර්තන මෝසම්/ Aw - නිවර්තන තෙත් හා වියළි (සැවානා) (ල. 3)

b). Am - නිවර්තන මෝසම් පිළිබඳ හැඳින්වීමක් තර තිබිය යුතුය (ල. 2)

iv. කාෂිකාර්මික කටයුතු වලදී / නායයෑම්, ගංවතුර, නියඟ ආදී ස්වාභාවික ආපදා / දෛනික කටයුතු අඩාල වීම / යටිතල පහසුකම්වලට හානි වීම (ල. 6)

04) i. පෘථිවි අභ්‍යන්තරයේ ඇත මැග්මා දුර්වල කුස්තුර ඔස්සේ ඉහළට විදාරණය වී ආක්‍රාන්ත හා නිෂ්ක්‍රාන්ත වීමේ ක්‍රියාවලියයි. (ගැලපෙන නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න - ල. 3)

ii.

| | | | |
|---|---|---|---|
| M - ෆූජියාමා | E - හෙක්ලා | B - ශාන්ත හෙලේනා | L - මයෝන් |
| F - විසුවියස් | A - මොනාලෝආ | H - ක්‍රැකටෝවා | G – එට්නා |

(ලකුණු ½ බැගින් - ල. 4)

iii. ඩයික / ආස්තර / ලැකොලිත / බැතොලිත / ලොපොලිත / පාකොලිත (රූප සටහන් සහිතව භූ රූප තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

iv. සාරවත් පස් කලාප බිහිවීම / වටිනා විපරීත පාෂාණ / සංචාරක කර්මාන්තය (ආදී කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 4)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## II කොටස

## <u>මානුෂ භූගෝල විද්‍යාව</u>

05). i. වගුව ඇසුරෙන් නිවැරදි කරුණු දැක්වීමකට ලකුණු ලබා දෙන්න (ල.4)

ii. ඉන්දියාව / චීනය / බංග්ලාදේශය / පිලිපීනය / පකිස්ථානය (හතරක් නම් කිරීමට - ල.4)

iii. රැකියා / අධ්‍යාපනය/ සරණාගත තත්ත්ව / පදිංචිය වෙනස් කිරීම / ඥාති සබඳතා / දේශපාලන අස්ථාවරත්වය / සිවිල් යුද්ධ / ස්වාභාවික ආපදා

(ආදී සාධක තුනක් කෙටියෙන් පැහදිලි කිරීමට ලකුණු 2 බැගින් - ල.6)

iv. රැකියා ඇබෑර්තු සම්පූර්ණ කරගත හැකිවීම / බුද්ධි ගලනය / මූලික පිරිවැයකින තොරව ශ්‍රමිකයන් ලබාගත හැකි වීම / සංක්‍රමණිකයන් ද බඳු ගෙවන්නන් වීම

(ආදී කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල.6)

06) i. ගැලපෙන නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණු ලබා දෙන්න (ල. 3)

ii. අධ්‍යාපනය / සංස්කෘතිය / සෞඛ්‍යය / වානිජ කටයුතු / දේශපාලනය / සන්නිවේදනය / ප්‍රවාහනය / තාක්ෂණය

(මින් පහක් නම් කිරීමට - ල. 5)

iii. ඉහත ක්ෂේත්‍ර දෙකක ව්‍යාප්තිය සිදුවන ආකාරය විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6

iv. පරිසර දූෂණය / ඉඩම් හිඟය / විරැකියාව / සෞඛ්‍ය ගැටළු / සමාජ අපචාර ක්‍රියා බහුල වීම

(ආදී ගැටළු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

07) i. බටදොඹලෙන / පාහියන්ගල / බෙලිලෙන / අළුලෙන / අලවල ලෙන / මාතොට / බලංගොඩ / බුන්දල / පතිරාජවෙල / මිනිහාගල්කන්ද / අනුරාධපුර හා පොළොන්නරු රාජධානි

(මින් තුනක් නම් කිරීමට - ල. 3)

ii. a). ධීවර ජනාවාස / වියළි කලාපීය ජනාවාස / වැව් ගම් / තෙත් කලාපීය ගම් / මහවැලි ගම්මාන / ගොවි ජනපද / හදබිම් නිවාස / වතු ජනාවාස / තරුණ ගම්මාන (මින් තුනක් නම් කිරීමට - ල. 3)

b). ඉන් එක් ගම්මානයක ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කිරීමට - ල. 2

iii. ජන සංඛ්‍යාව / ආර්ථික කටයුතු / යටිතල පහසුකම් / දෛනික සංචලනය

(ආදී නිර්ණායක තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ල. 6)

iv. ගැමි නාගරික ජනාවාසයක ලක්ෂණ නිවැරදි ව විස්තර කර ඇත්නම් - ල. 6

08) i. වාරි තාක්ෂණය / ජාන තාක්ෂණය / හරිත විප්ලවය / නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය / ඓන්ද්‍රීය ගොවිතැන

(හතරක් නම් කිරීමට ලකුණු ½ බැගින් - ල. 2)

ii. නව මාදිලියේ වැඩි ඵලදායී බීජ නිපදවීම (මුහුන් හා දෙමුහුන් තාක්ෂණය) / නව තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය යන අංශවල සිදුවූ දියුණුව හා වෙනස්කම් විස්තර කර තිබිය යුතුය - ල. 6

iii. පළිබෝධනාශක, බීජ, යන්ත්‍රෝපකරණ, පොහොර, රසායනික ද්‍රව්‍ය ආදිය හා බහු ජාතික සමාගම් මගින් ඇතිකරන ගැටළු විස්තර විය යුතුය - ල. 6

iv. පාංශු කළමණාකරණය / වල් පැළෑටි මර්දනය / පළිබෝධ හානි වැළැක්වීම / බහු බෝග වගාව

(යනාදී ක්‍රමවේද තුනක් විස්තර කිරීමට ලකුණු  බැගින් - ල.6)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

<u>භූගෝල විද්‍යාව II පත්‍රය - පිළිතුරු</u>

**I කොටස - <u>භෞතික භූගෝල විද්‍යාව</u>**

01) i. පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා දූර්වල කුස්තුර ඔස්සේ ඉහළම විචාරණය වී අක්‍රාන්ත හා නික්‍රාන්ත වීමේ ක්‍රියාවලිය විස්තර කළ යුතුයි.

ii. 1. සයිබීරියානු
2. ඩෙකෑන්
3. ඩ්‍රැගන් බර්ග්
4. පරානා

iii. බැතොලිත, ලැකොලිත, පාකොලිත, ඩයික, ආස්තර, හුරුස 03ක නිර්මාණාත්මක ක්‍රියාවලිය රූප සටහන් ඇඳ තිබිය යුතුය.

iv. * සාරවත් පස් කලාප වගා කිරීම්
ඩෙකෑන් - කපු වගා/ පරිප්පු
පරානා ් කෝපි
* යමහල් විධාරණ මාර්ග ආශ්‍රිත විපරිත වීමෙන් නිර්මාණය වන වටිනා විපරිත පාෂාණ ආශ්‍රිත ආභරණ කර්මාන්තය.
* උණුදිය උල්පත්/ශීසර සීත රටවල සංචාරක කර්මාන්ත ප්‍රදේශ හා හෝටල්වල පිහිනුම් තටාක සඳහා

02) i. 1. චෙනද්‍රීය හුණුගල් නිර්මාණය 2. රසායනික අවක්ෂේප ක්‍රමය

ii. ස්ලෝපීනියාව
රුසියාවේ යෙනිසි ප්‍රදේශය
යුකටාන් අර්ධද්වීපය
ශ්‍රී ලංකාව

iii. 1. කුමුටුවල 2. දෝලිනා 3. හිරි කළුණු

iv. අරුවක්කාර ප්‍රදේශයේ හුණුගල් සිමෙන්ති නිෂ්පාදනය භාවිතා කිරීම.
මාතලේ දිගන ප්‍රදේශවල අලුහුණු නිපදවීම.(ඩොලමයිට්)
දකුණු වෙරළ තීරයේ හිරිගල් හුණු නිපදවීමට භාවිතා කිරීම.

03) i. ජෛව හා අජෛව සංරචක අතර අන්තර් සම්බන්ධතා පවත්වන ඒකකයකි.

ii. වනාන්තර වල ශාක අජෛව සංරචක වන පස, ජලය, වාතය, හිරු එළිය ලබාගෙන ප්‍රභාසංස්ලේෂන සිදුකරයි.
ඒ තුල ඇති ජීවීන් නැවත එම කොටස් පරිසරයට මුදාහරී.

iii. වනාන්තර එළිකිරීම කඩොලාන විනාශය තෙත්බිම් ගොඩකිරීම

iv. අන පනත් ක්‍රියාත්මක කිරීම මධ්‍යම පරිසර අධිකාරියට බලය පැවරීම
පරිසර සංවිධාන ඒකරාශී වීම ජනතාව දැනුවත් කිරීම

04) i. සංවහන - නිවර්තන කලාපයේ ශ්‍රී ලංකා පිහිටා ඇති නිසා උෂ්ණත්වය වැඩිය.
මෝසම් - අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ පිහිටීමයි.
වාසුළි - බෙංගාල බොක්කට සාපේක්ෂ පිහිටීම (අඩු පීඩන කලාප)

ii. නිවරදි පිළිතුරට ලකුණු ලබාදීම

iii. අධික වර්ෂාව නිසා නායයෑම්
පාංශු ඛාදනය වේගවත් වීම
ජලාශ හා ගංගා නිම්න පත්ල ගොඩවීම

iv. - කෘෂිකර්මාන්තය හා කෘෂි භෝග පදනම් වීම - නාය යෑම් ගංවතුර වැනි උපද්‍රව ඇතිකිරීම
- දෛනික කටයුතු අඩාල වීම



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

## II කොටස

**මානුෂ භූගෝල විද්‍යාව**

05). i. වාර්ෂිකව සංවර්ධිත රටවල සංක්‍රමණිකයින් වැඩි වී ඇත
සං.වෙ.ප.රටවල වාර්ෂිකව අඩුවී ඇත
සංවර්ධිත රටවල සංක්‍රමනිකයින් වැඩියි. සං.වෙ.ප. රටවල සංක්‍රමණිකයින් අඩුයි.

ii. ඉන්දියාව, චීනය, බංග්ලාදේශය, පිලිපීනය, පකිස්ථානය

iii. 1. රැකියා 2.අධ්‍යාපනය 3.ඥාති සබඳතා 4.සරණාගත 5.පදිංචිය වෙනස් කිරීම

iv.

06) i. රටක නාගරික ප්‍රදේශවල ජීවත්වන ජන සංඛ්‍යාව එරට මළු ණය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දක්වයි.

ii. අධ්‍යාපනය/ සංස්කෘතිය/ සෞඛ්‍ය/ වාණිජ කටයුතු/ දේශපාලනය

iii. 1. ජන සංඛ්‍යාව
2. ආර්ථික කටයුතු
3. පරිපාලන මායිම්
4. නාගරික කාර්යයන්

iv. නාගරික ජන සංඛ්‍යාව සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහළයාම.
නගර ගෝලීයකරණයේ බලපෑමට ලක්වීම.
දේශසීමා අභිබවා වගර ව්‍යාප්ත වීම.

07) i. පුරාණ වැව්, වතු ජනාවාස, මහවැලි ජනාවාස, ගොවිජනපද, තෙත්කලාපීය ගම්

ii. නිවැරදි රූප සටහනට හා විස්තරයට ලකුණු ලබාදෙන්න

iii. ජන සංඛ්‍යාව ආර්ථික කටයුතු යටිතල පහසුකම්

iv. පේළි ක්‍රමය වෙනස්වී පොකුරු ජනාවාස දෛනික ආදායම් ඉහළ දැමීම
යටිතල පහසුකම් සංවර්ධනය වතු පාසල් ඉදිකිරීම

08) i. හරිත විප්ලවය ජාන තාක්ෂණය ඓන්ද්‍රිය කෘෂිකර්මය

ii. 1943 දී මෙක්සිකෝව් ඉරිඟු වගාව සම්බන්ධයෙන් නෝර්මන් බෝලෝර්ඩ් ඇතුළු පිරිසක් විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය 1963දී ලෝක ආහාර හා ලෝක කෘෂිකාර්මික වැඩ සැලැස්ම මගින් හරිත විප්ලවය ලෙස ප්‍රචලිත කරන ලදී.

iii. මුහුන් කිරීම දෙමුහුන් කිරීම යන්ත්‍රසූත්‍ර භාවිතය
යෙදවුම් භාවිතය අදි 03ක් විස්තර කළ යුතුය.

iv. සමාජ - පංතිභේදයක් ඇතිවීම් ආර්ථික - ගොවීන් ණයගැති වීම පාරිසරික - ජෛව විවිධත්වයට හැනි ඇතිවීම



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00